# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1513/15 – 2007 සැප්තැම්බර් 04 වැනි අඟහරුවාදා – 2007.09.04

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍ය, අහමඩ් ලෙබ්බේ මරික්කාර් අතාඋල්ලා වන මම, එකී මණ්ඩලයට ගම්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඔක්සිහාරක පුතික ටැංකියක් සහ ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

අහමඩ් ලෙබ්බේ මරික්කාර් අතාඋල්ලා,<br>
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2007 අගෝස්තු මස 29 වැනි දින,<br>
අංක 34,<br>
නාරාහේන්පිට පාර, නාවල,<br>
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.<br>
05/02/01/798.

උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වහුගේපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වහුගේපිටිය ගමේ පිහිටි කෝපිවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 03ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;

*නැගෙනහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;

*දකුණට* : ඇල මාර්ගය ;

*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස.

*හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්*:

01. ඒ. අරිෆා උම්මා මිය, අංක 138, වහුගේපිටිය, පුස්සැල්ලාව.

02. නස්ලිහා මිය, අංක 138, වහුගේපිටිය, පුස්සැල්ලාව.

03. බල්කිස් මිය සහ තවත් අය, අංක 138, වහුගේපිටිය, පුස්සැල්ලාව.

09-737

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍ය, අහමඩ් ලෙබ්බේ මරික්කාර් අතාඋල්ලා වන මම, ගිරිඋල්ල ජල සම්පාදන ක්‍රමයේ ජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩමේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

අහමඩ් ලෙබ්බේ මරික්කාර් අතාඋල්ලා,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2007 අගෝස්තු මස 29 වැනි දින,
අංක 34,
නාරාහේන්පිට පාර, නාවල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
05/02/01/799.

උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 1566 – මාහරගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හාල්පනේ වාගොල්ල ගමේ ගිරිඋල්ල බලවේග පේෂකර්මාන්තය පිහිටි ඉඩම නැමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 02ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | |
|---|---|
| *උතුරට* | : ඉන්දික බණ්ඩාර ජයතිලක මහතාගේ ඉඩම ; |
| *නැගෙනහිරට* | : අඩි 12 මාර්ගය (පැරණි තානායම් මාර්ගය) ; |
| *දකුණට* | : මීගමුව – කුරුණෑගල මහා මාර්ගය ; |
| *බටහිරට* | : හටන්ගල්ල ප්‍රාදේශීය සභා උපකාර්යාලයට යාබද අඩිපාර. |

*හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්*:

01. කළමනාකාර අධ්‍යක්ෂ,
සී. ස. හයිකෝ විවින් ඉන්ඩස්ට්‍රීස් සමාගම,
ගිරිඋල්ල, හාල්පනේ.

02. හයිඩර් ට්‍රේඩර්ස්,
අංක 233, කෙලින් වීදිය,
කොළඹ 11.

09-738

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.